# සාමාන්‍ය සමයේ විසිඅටවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 4 : 13, 16–18

"බලාපොරොත්තු රහිත තත්ත්වයක දී ඔහු විශ්වාස කළේය."

ආබ්‍රහම්ට හෝ ඔහුගේ දරු පෙළපතට හෝ ලෝකය උරුම වන්නේ ය යන පොරොන්දුව කිසිසේත් නීතිය පිළිපැදීම නිසා ඇති වූවක් නොවේ. එය ඇති වූයේ ඇදහිල්ල නිසා වන, ධර්මිෂ්ඨකම හේතුකොටගෙන ය.

මේ නිසා දේව පොරොන්දුව වරප්‍රසාදයේ ප්‍රතිඵලයක් වන පිණිස එය ඇදහිල්ල මත රඳා පවතී. එසේ වන්නේ ආබ්‍රහම්ගේ දරු පෙළපතට අයත් හැමට ම, එනම් නීතිය අනුව ජීවත් වන අයට පමණක් නොව, අපගේ පියාණන් වන ආබ්‍රහම්ගේ ඇදහිල්ල අනුව ජීවත් වන අයටත්, ඒ ඒ පොරොන්දු වලංගු වන බව සහතික කරන පිණිස 'මම ඔබ බොහෝ ජාතීන්ගේ පියා කොට පත් කළෙමි' යි ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇත්තේ මේ නිසා ය. ඒ පොරොන්දුව ආබ්‍රහම් ලැබුවේ තමා අදහන, මළවුන් හට ජීවිතය දෙන, නැති දේ ඇති කරන, දෙවියන් වහන්සේගෙන් ය. බලාපොරොත්තු රහිත තත්ත්වයක දී වුව ද ඔහු දෙවියන් වහන්සේගේ පොරොන්දුව විශ්වාස කළේ ය. ඔහු බොහෝ ජාතීන්ගේ පියා වූයේ 'ඒ සා මහා පෙළපතක් ඔබට ඇති වන්නේ ය' යන කීම පරිදි ය.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **105 : 6-9, 42-43**

පිළිතුර: සමිඳාණෝ තම ගිවිසුම සදහට ම සිහි කරන සේක.

ගීය:

සමිඳාණන්ගේ මෙහෙකරුවන් වූ ඉශ්රායෙල් වංශයෙනි,
එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවෙනි,
එතුමාණෝ අපේ දෙවි සමිඳාණෝ ය. එතුමන්ගේ විනිසය මුළු පොළොවෙහි ය.

එතුමන්ගේ ගිවිසුම සදහට ම සිහි කරන්න. පරම්පරා දහසක් දක්වා එතුමන්ගේ අණ පණත් සිහි කරන්න.
ඒ ගිවිසුම එතුමාණෝ ආබ්‍රහම් සමඟ කළ සේක.
ඊසාක්ට ද දිවුරුම් දුන් සේක.

එතුමාණෝ සිය මෙහෙකරු ආබ්‍රහම් ද ඔහුට දුන් ශුද්ධ ගිවිසුම ද සිහි කළ සේක.
මෙසේ එතුමාණෝ සිය සෙනඟ පිටත ගෙන ගිය සේක.
ඔව්හු ප්‍රීති ප්‍රමෝදයෙන් හඬ නගා ගී ගැයූහ.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබවහන්සේගේ ක්‍රියා මාර්ගය මට ඉගැන්වුව මැනව.
ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය.
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය"යි ස්වාමීන් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 12: 8-12

"ඔබ කිව යුතු දේ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට දන්වන සේක."

"තවද, යමෙක් මනුෂ්‍යයන් අබිමුවෙහි මා පිළිගත් බවට සාක්ෂි දරන්නේ ද, මනුෂ්‍ය පුත්‍රයාණෝත් දෙවියන් වහන්සේගේ දූතයන් අබිමුවෙහි ඔහු පිළිගත් බවට සාක්ෂි දරන සේක. එහෙත් මනුෂ්‍යයන් අබිමුවෙහි මා ප්‍රතික්ෂේප කරන තැනැත්තේ දෙවියන් වහන්සේගේ දූතයන් අබිමුවෙහි දී ප්‍රතික්ෂේප කරනු ලැබේ ය"යි මම ඔබට කියමි. මනුෂ්‍ය පුත්‍රයාණන්ට විරුද්ධව යමක් කරන කවරෙකුට වුව ද කමාව ලැබෙන්නේය. එහෙත් ශුද්ධාත්මයාණන්ට විරුද්ධව අපහාස කරන්නාට නම් කමාවක් නොලැබෙන්නේය. ඔවුන් ධර්ම ශාලාවලට ද අධිපතීන් හා ආණ්ඩුකාරයන් ඉදිරියට ද ඔබ ගෙන යන කල, ඔවුන්ට උත්තර දෙන්නේ කෙසේද කියාවත් කියන්නේ කුමක්ද කියාවත් සිතමින් කරදර නොවන්න. ඔබ කිව යුතු දේ ඒ මොහොතේ දී ම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට දන්වනු ඇත.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.